# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
## ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය
## இலங்கை மகாவலி அதிகாரசபை
பிரதான அணைகள் மற்றும் நீர்த்தேக்கங்களின் செயற்பாட்டுப் பிரிவு
## Mahaweli Authority of Sri Lanka
Division of Major Dams & Reservoir Operation




වික්ටෝරියා වේල්ල
*Victoria Dam*


**නිලගම, දිගන, රජවැල්ල.** திகன, உத்தியோகபூர்வ கிராமம், ரஜவெல்ல. Digana Village, Rajawella.


HW/HO/DIR/GENERAL
2025.12.18

**සියළුම මාධ්‍ය ආයතන වෙත.**

මහත්මයාණෙනි / මහත්මියනි,

**<u>පවතින වර්ෂාපතනයත් සමඟ මහවැලි අධිකාරියට අයත් ජලාශ වාන් දැමීම සම්බන්ධවයි.</u>**

මහවැලි අධිකාරියේ ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට යටතේ පාලනය වන ජලාශ වාන් දැමීම පිළිබඳව දැනුවත් කිරීමයි.

දැනට පවතින වර්ෂාපතනය අනුව, මහවැලි ද්‍රෝණියට අයත් ප්‍රධාන ජලාශ අතුරින් ,

වික්ටෝරියා, රංදෙණිගල, රංටැඹේ යන ජලාශ දැනටමත් වාන් දැමීම ආරම්භ වී ඇති අතර, ඒ හේතුවෙන් රංටැඹේ ජලාශයෙන් මිණිපේ අමුණ හරහා මහවැලි ගඟට මුදා හරින ජල ප්‍රවාහය පවතින වර්ෂාපතනයේ ප්‍රමාණය අනුව වැඩි විය හැකි බවත්, ලොග්ගල්ඔය, දියබානාඔය, හැපොලඔය හා උල්හිටිය ජලාශ වල වාන් මඟින් පිටවන ජලධාරිතාව හා බදුළුඔයේ ජල ධාරිතාවද සෘජුවම මහවැලි ගඟට එකතු වන බැවින්, මහවැලි ගඟේ ජල මට්ටම ඉහළ යා හැකි බැවින්, පහත් නිම්න ප්‍රදේශයේ සිටින ජනතාවට අවධානයෙන් සහ විමසිලිමත්ව සිටින ලෙස දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

එමෙන්ම කලාවැව ද්‍රෝණියට අයත්, කලාවැව හා කණ්ඩලම ජලාශ දැනටමත් වාන් දමමින් ඇති අතර, බෝවතැන්න, ඉබ්බන්කටුව, මොරගහකන්ද හා කළුගඟ යන ජලාශ වලද ජල මට්ටම උපරිම මට්ටමේ පවතින බැවින්, පෝෂිත ප්‍රදේශ වලට ඇතිවන වර්ෂාපතනයේ ප්‍රමාණය අනුව ඉදිරියේදී එම ජලාශද වාන් දැමිය හැකි බවත්, මාදුරුඔය ජලාශයද උපරිම ජල මට්ටමේ ඇති බැවින්, එම ජලාශද ඉදිරියේදී වාන් දැමීම සිදුවිය හැක.

තවද, කාලගුණය පිළිබඳ ඉදිරි පුරෝකථනයක්ට අනුව, වාන් ජල ප්‍රවාහය වැඩි විය හැකි බැවින්, ජලාශ වාන් දැමීම නැරඹීම හෝ විවිධ කටයුතු සඳහා ජලාශ පෙදෙස් වලට ළඟාවීමෙන් වලකිව ලෙස ද මහජනතාගේ ආරක්ෂාව පිණිස දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

(ඉංජි: ඩී.එම්.ධර්මදාස)
අධ්‍යක්ෂ,
ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - දිගන.

---

- අධ්‍යක්ෂ ජනරාල් - කාරුණික දැ.ගැ.ස හා අ.ක.ස.
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තා/සේවා) - කාරුණික දැ.ගැ.ස හා අ.ක.ස.
- කාර්යභාර ඉංජිනේරු (කොත්මලේ/වික්ටෝරියා/රන්දෙණිගල පොල්ගොල්ල/මාපාකඩ/මාදුරුඔය/මොරගහකන්ද/බෝවතැන්න/උඩවලව/උමාඔය) - කාරුණික දැ.ගැ.ස හා විමසිලිමත්ව කටයුතු කිරීම සඳහා.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථනය - අධ්‍යක්ෂ<br>தொலைபேசி - பணிப்பாளர்<br>Telephone - Director | 081-2374393 | දුරකථනය - කාර්යාලය<br>தொலைபேசி - அலுவலகம்<br>Telephone - Office | 081-2374259<br>081-2374383 | ෆැක්ස් අංකය<br>தொலைநகல்<br>Fax No. | 081-2374269 | විද්‍යුත් තැපැල්<br>மின்னஞ்சல்<br>E-mail | dams@slt.lk<br>dswrppdddigana@gmail.com |